**ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ (NTDND & EI) ව්‍යාපෘතිය**

# ඇබෑර්තු - විදුලි / සිවිල් අධිකාරී

## මාස 12 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත

ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශයට විදුලි / සිවිල් අධිකාරී තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් හා අත්දැකීම්ලත් ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා :**

**විදුලි / සිවිල් අධිකාරී තනතුර (විදුලි අධිකාරී - 04 සිවිල් අධිකාරී - 03)**

- විදුලි සහ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පහත සඳහන් එක් අධ්‍යාපන සුදුසුකමක් සපුරාලිය යුතුය.

  ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT), ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES), තාක්ෂණ ඩිප්ලෝමාව – ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ඉංජිනේරුවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ තාක්ෂණවේදය පිළිබඳ ජාතික සහතිකපත්‍ර පාඨමාලාව (NCT) සමග සුදුසුකම් සැපිරීමෙන් පසු තාක්ෂණික නිලධාරී තනතුරක වසර 5 ක පළපුරුද්ද.
- වයස අවුරුදු 35 ට අඩු විය යුතුය.
- විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදහැරීම් වැනි විදුලි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් අධීක්ෂණය, ප්‍රගතිය අධීක්ෂණය, පරීක්ෂණ හා බලගැන්වීම්, මහජන සම්බන්ධතා කටයුතු වැනි කාර්යයන්හි අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.
- සිංහල හෝ දමිල සහ ඉංග්‍රීසි භාෂා හැසිරවීමෙහි මනා දැනුමක් තිබිය යුතුය.

**රාජකාරී**

- ව්‍යාපෘතියේ කාර්යයන් හැසිරවීමට ව්‍යාපෘති කළමනාකාරිත්වය සඳහා අදාළ තාක්ෂණික හා කළමනාකරණ සේවාවන් ලබාදීම.

| | | |
|---|---|---|
| **වේතනය** | : | 2019 මාර්තු 15 දිනැති මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට යටත්වේ. |
| **තෝරා ගැනීම** | : | සුදුසුකම් සපුරන අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **කාර්ය ස්ථානය** | : | ව්‍යාපෘති කාර්යාලය, ටොරින්ටන්, කොළඹ 07. |
| **ව්‍යාපෘති වැඩබිම්** | : | දෙහිවල හා බත්තරමුල්ල |
| **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** | : | 2021 ඔක්තෝබර් 13 දින. |

**සේවයට අදාළ කොන්දේසි :**

- සේවය සඳහා බඳවාගැනීම මාස දෙළහක (12) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.
- මෙම ව්‍යාපෘතියේ ඉදිරි අවශ්‍යතාවය මත පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරනු ලැබිය හැකිය. පත්වීම් ලිපියේ සඳහන් පරිදි සේවය දීර්ඝ කිරීමේ හෝ අවසන් කිරීමේ පූර්ණ අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය සතුවේ.
- ලංකා විදුලිබල මණ්ඩලයට ස්ථිර සේවකයන් බඳවා ගැනීමකදී ඇතුළත් වීමේ සුදුසුකමක් ලෙස මෙම පත්වීම සලකනු නොලැබේ.

**වෙනත් ප්‍රතිලාභ :**

01. තෝරාගත් අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා හිමිකම් දරන අතර ඒ සඳහා වැටුපින් 10% කින් දායක වියයුතු අතර, ව්‍යාපෘතිය මගින් වැටුප මෙන් 15% ක දායකත්වයක් දරනු ඇත.
02. සේවක භාරකාර අරමුදල (ETF) සඳහා වැටුප මෙන් 3% ක දායකත්වයක් ව්‍යාපෘතිය මගින් දරනු ඇත.

ඉහත සුදුසුකම් සහිත අදුම්කරුවන් විසින් තම සම්පූර්ණ නම, පුද්ගලික සහ රාජකාරී ලිපිනය, දුරකථන අංක හා තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ විස්තර සහිත සම්පූර්ණ අයදුම්පත්‍රයක් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "විදුලි / සිවිල් අධිකාරී ඇබෑර්තු – **NTDND & EI** ව්‍යාපෘතිය" යනුවෙන් සටහන් කළ යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළයුතු අතර, යම් හෙයකින් තෝරාගතහොත් නිදහස් කළ හැකිද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

**වැඩිදුර තොරතුරු සඳහා :**

**ව්‍යාපෘති අධ්‍යක්ෂක (NTDND & EI ව්‍යාපෘතිය) දු. අංක : 011-2589814 ෆැක්ස් : 011-2081690**

**ව්‍යාපෘති අධ්‍යක්ෂක - NTDND & EIP, ලංකා විදුලිබල මණ්ඩලය, අංක 18, කොනිස්ටන් පෙදෙස, කොළඹ 07.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

*විදුලිබලයෙන් සැපිරිමත් දිවියක්*